# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2466/22 - 2025 දෙසැම්බර් මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2025.12.11**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සුරාබදු ආඥාපනත**

අංක 03/2025 දරන සුරාබදු නිවේදනය

(52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 32 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලදුව 2025 වසරේ දෙසැම්බර් මස 05 දින පාර්ලිමේන්තුවේ යෝජනාවක් මඟින් ස්ථිර කරන ලද රීති.

මෙම රීති 2025 දෙසැම්බර් මස 12 වැනි දින සිට බලපැවැත්වේ.

අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2025 දෙසැම්බර් මස 11 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**සුරාබදු බලපත්‍ර ගාස්තුවලට අදාළ වන රීති**

1. පහත උපලේඛනයේ II වන තීරුව යටතේ නිශ්චිතව දක්වා ඇති සෑම සුරාබදු බලපත්‍ර කාණ්ඩයක් සඳහා එම උපලේඛනයේ පිළිවෙලින් III, IV සහ V වන තීරු යටතේ ඊට අනුරූපව නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රමාණයන් අනුව වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තුව, ආරක්ෂිත ඇප තැන්පතු මුදල සහ කර්මාන්ත ප්‍රවේශය සඳහා එක් වරක් අයකරනු ලබන ගාස්තුව ගෙවිය යුතු වන්නේය.

2. එම උපලේඛනයේ IV වන තීරුව යටතේ දක්වා ඇති ආරක්ෂිත ඇප තැන්පතු මුදල සහ මීන් පෙර බලපැවැත්වූ සුරාබදු බලපත්‍ර ගාස්තුවලට අදාළ වන රීති යටතේ දැනටමත් ගෙවා ඇති ආරක්ෂිත ඇප තැන්පතු මුදල අතර වෙනසක් වේ නම්, එම ඉතිරි මුදල මෙම රීති බලාත්මක වන දින සිට දින තිහක (30) කාලයක් තුළ දී සුරාබදු කොමසාරිස් ජනරාල් වෙත ගෙවිය යුතු වන්නේය.


1A - G 45864 — 28 (2025/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. එම උපලේඛනයේ V වන තීරුව යටතේ දක්වා ඇති කර්මාන්ත ප්‍රවේශය සඳහා එක් වරක් අයකරනු ලබන ගාස්තුව මෙම රීති බලාත්මක වීමෙන් පසුව ඊට අදාළ බලපත්‍රය ප්‍රථම වරට නිකුත් කිරීමේ දී, අදාළ බලපත්‍රලාභියා විසින් එක් වතාවක් පමණක් ගෙවිය යුතු ආපසු නොගෙවන ගාස්තුවක් විය යුතු අතර එය සුරාබදු කොමසාරිස් ජනරාල් වෙත ගෙවිය යුතු වන්නේය.

4. 2017 දෙසැම්බර් 11 දිනැති අංක 2049/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද අංක 1004 දරන සුරාබදු නිවේදනය, 2018 අප්‍රේල් 06 දිනැති අංක 2065/57 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද අංක 09/2018 දරන සුරාබදු නිවේදනය, 2024 ජනවාරි 12 දිනැති අංක 2366/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද අංක 01/2024 දරන සුරාබදු නිවේදනය සහ 2024 පෙබරවාරි 01 දිනැති අංක 2369/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද අංක 03/2024 දරන සුරාබදු නිවේදනය මෙම රීති බලපැවැත්වීමත් සමඟ අවලංගු වේ.

උපලේඛනය

| *I වන තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* | *IV වැනි තීරුව* | *V වැනි තීරුව* |
|---|---|---|---|---|
| *අනු අංකය* | *සුරාබදු බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය* | *වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තුව (රුපියල්)* | *ආරක්ෂිත ඇප තැන්පතු මුදල (රුපියල්)* | *කර්මාන්ත ප්‍රවේශය සඳහා එක් වරක් අයකරනු ලබන ගාස්තුව (රුපියල්)* |
| 1 | ස්කාගාර බලපත්‍රය (ඩී 1)<br>(i) ස්කාගාර බලපත්‍රය (තල් අරක්කු හැර)<br>(ii) ස්කාගාර බලපත්‍රය (තල් අරක්කු) | 2,000,000<br>300,000 | 250,000<br>50,000 | 25,000,000<br>5,000,000 |
| 2 | රා බෝතල්ගත කිරීමේ බලපත්‍රය (බී 2)<br>(i) පොල් රා බෝතල්ගත කිරීම<br>(ii) තල් රා බෝතල්ගත කිරීම | 1,500,000<br>500,000 | 1,000,000<br>1,000,000 | 10,000,000<br>1,000,000 |
| 3 | විනාකිරි නිෂ්පාදනාගාර බලපත්‍රය | 500,000 | 50,000 | 2,500,000 |
| 4 | කිරිපොන්සා හෝ වයින් නිෂ්පාදනය, බෝතල්ගත කිරීම සහ විකිණීම සඳහා දෙන බලපත්‍රය | 100,000 | 50,000 | 500,000 |
| 5 | ඕනෑම තාල වර්ගයේ ගසකින් ලබාගන්නා ස්වභාවික ද්‍රව්‍ය හෝ වෙනත් පැලෑටි වලින් හෝ ආසවනය කිරීම හැර වෙනත් ක්‍රියාවලියකින් රා හැරෙන්නට ධාන්‍ය වලින් සෑදූ මධ්‍යසාර 4% පරිමාවට වඩා අඩංගු නොවන මත්පැන් නිෂ්පාදනය කිරීමට දෙන බලපත්‍රය | 100,000 | 50,000 | 100,000 |
| 6 | ඕනෑම තාල වර්ගයේ ගසකින් ලබාගන්නා ස්වභාවික ද්‍රව්‍ය හෝ වෙනත් පැලෑටි වලින් හෝ ආසවනය කිරීම හැර වෙනත් ක්‍රියාවලියකින් රා හැරෙන්නට ධාන්‍ය වලින් සෑදූ මධ්‍යසාර 4% පරිමාවට වඩා අඩංගු මත්පැන් නිෂ්පාදනය කිරීමට දෙන බලපත්‍රය | 100,000 | 50,000 | 100,000 |
| 7 | සයිඩර් නිෂ්පාදනය සඳහා දෙන බලපත්‍රය | 100,000 | 50,000 | 500,000 |
| 8 | විකිණීම සඳහා මත්පැන් බෝතල් කිරීමට බලපත්‍රය (සුරාබදු බී1) | 5,000,000 | 10,000,000 | 5,000,000 |
| 9 | ස්ප්‍රීතු ගබඩා කිරීම සඳහා ගුදමක් පිහිටුවීමේ හෝ ක්‍රියා කිරීමට බලපත්‍රය (ගුදම් 1) | 100,000 | 50,000 | 1,000,000 |

| *I වන තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* | *IV වැනි තීරුව* | *V වැනි තීරුව* |
|---|---|---|---|---|
| *අනු අංකය* | *සුරාබදු බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය* | *වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තුව (රුපියල්)* | *ආරක්ෂිත ඇප තැන්පතු මුදල (රුපියල්)* | *කර්මාන්ත ප්‍රවේශය සඳහා එක් වරක් අයකරනු ලබන ගාස්තුව (රුපියල්)* |
| 10 | රා එකතු කිරීමේ මධ්‍යස්ථාන බලපත්‍රය | 50,000 | 25,000 | 100,000 |
| 11 | මත්පැන් අපනයනය කිරීම සඳහා වූ බලපත්‍රය | 100,000 | 50,000 | 100,000 |
| 12 | බලපත්‍ර ලත් වෙළඳුන්ට දෙනු ලබන (නිෂ්පාදකයින්ගේ) තොග වෙළඳ අරක්කු/බියර්/විදේශීය මත්පැන් බෙදාහැරීමේ බලපත්‍රය (අ. නි. 6) | 1,500,000 | 500,000 | 2,500,000 |
| 13 | මත්පැන් සඳහා තොග වෙළඳ බලපත්‍රය (ර. බි. 3) | | | |
| | (i) මත්පැන් නිෂ්පාදකයින් සඳහා<br>(ii) මත්පැන් නිෂ්පාදකයින් නොවන අය සඳහා | 2,000,000<br>2,000,000 | 1,000,000<br>1,000,000 | 1,000,000<br>2,500,000 |
| 14 | මත්පැන් සිල්ලරට පිටතට විකිණීමේ බලපත්‍ර (ර. බි. 4)<br>(i) මහ නගර සහා ප්‍රදේශ සඳහා<br>(ii) නගර සහා ප්‍රදේශ සඳහා<br>(iii) අනෙකුත් ප්‍රදේශ සඳහා<br>(iv) ඉල්ලුම්කාර ව්‍යාපාරයේ/සමාගමේ හෝ එහි මව් ව්‍යාපාරයේ/සමාගමේ වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 1,000 ඉක්මවන වෙළඳ සංකීර්ණ/ වෙළඳසැල් වැනි ආයතන සඳහා ඒවා පිහිටි ප්‍රදේශ නොසලකා දෙනු ලබන මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍රය | <br>1,000,000<br>800,000<br>600,000<br>1,500,000 | <br>500,000<br>500,000<br>500,000<br>500,000 | <br>15,000,000<br>12,500,000<br>10,000,000<br>15,000,000 |
| 15. | හෝටල් බලපත්‍රය (ර. බි. 7) සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමත කරනු ලැබූ සහ සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය රහිත හෝටල් කාමර 5 හෝ ඊට වැඩි<br>(i) කාමර 400 ක් හෝ ඊට වැඩි<br>(ii) කාමර 200 සිට 399 දක්වා<br>(iii) කාමර 20 සිට 199 දක්වා<br>(iv) කාමර 20 ට අඩු | <br>1,000,000<br>750,000<br>350,000<br>200,000 | <br>100,000<br>100,000<br>100,000<br>100,000 | <br>500,000<br>250,000<br>200,000<br>100,000 |
| 16. | හෝටල් පීඨිකා බලපත්‍රය (ර. බි. 8) | 150,000 | 50,000 | 250,000 |
| 17. | සිනමා සඳහා විනෝද පීඨිකා බලපත්‍රය (ර. බි. 9) | 100,000 | 50,000 | 250,000 |
| 18. | දුම්රිය භෝජනාගාර බලපත්‍රය (ර. බි. 10) | 100,000 | 50,000 | 250,000 |
| 19. | භෝජනාගාර බලපත්‍රය (සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය සහිත/අනුමැතිය රහිත) (ර. බි. 11) | 300,000 | 100,000 | 250,000 |
| 20. | තානායම් බලපත්‍රය (ර. බි. 12) | 200,000 | 50,000 | 250,000 |
| 21. | හිමිකාර සමාජ ශාලා බලපත්‍රය (ර. බි. 13) | 2,000,000 | 500,000 | 5,000,000 |
| 22. | සම්භාෂණ හා විනෝද කාර්යයන් සඳහා වන සමාජ ශාලා, ක්‍රීඩා සමාජ හා සාමාජිකයින් සඳහා පමණක් වන සමාජ ශාලා සඳහා වූ බලපත්‍රය (ර. බි. 13 ඒ)<br>(i) මහ නගර සහා ප්‍රදේශ සඳහා<br>(ii) නගර සහා ප්‍රදේශ සඳහා<br>(iii) අනෙකුත් ප්‍රදේශ සඳහා | <br>500,000<br>400,000<br>300,000 | <br>100,000<br>100,000<br>100,000 | <br>500,000<br>500,000<br>500,000 |

| *I* වන තීරුව | *II* වැනි තීරුව | *III* වැනි තීරුව | *IV* වැනි තීරුව | *V* වැනි තීරුව |
|---|---|---|---|---|
| *අනු අංකය* | *සුරාබද්දු බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය* | *වාර්ෂික සුරාබද්දු බලපත්‍ර ගාස්තුව (රුපියල්)* | *ආරක්ෂිත ඇප තැන්පතු මුදල (රුපියල්)* | *කර්මාන්ත ප්‍රවේශය සඳහා එක් වරක් අයකරනු ලබන ගාස්තුව (රුපියල්)* |
| 23. | අවස්ථා බලපත්‍රය (දිනකට/එක් පීයීකාවකට) (ර. බි. 14) | 50,000 | - | - |
| 24. | විකුණන වේලාවන් දීර්ඝ කිරීමට අතිරේක බලපත්‍රය (සතියකට) ර. බි. 15) | 50,000 | - | - |
| 25. | වෙන්දේසිකරුවන්ගේ බලපත්‍රය (දිනකට) (ර. බි. 16) | 100,000 | - | - |
| 26. | පරිපාක ස්ප්‍රීතු/ඊතයිල් මධ්‍යසාර විකිණීමේ බලපත්‍රය (ර. බි. 17) | 100,000 | 100,000 | 10,000,000 |
| 27. | ඖෂධීය ස්ප්‍රීතු විකිණීමේ බලපත්‍රය (ර. බි. 18) | 100,000 | 50,000 | 500,000 |
| 28. | බියර්, ඒල්, ස්ටවුට් හා වයින් විකිණීම සඳහා වූ විශේෂ බලපත්‍රය (සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය සහිත/අනුමැතිය රහිත)<br>(i) සිල්ලරට පිටතට විකිණීම සඳහා (ර. බි. 22 ඒ)<br>(ii) ස්ථානීය පරිභෝජනය සඳහා (ර. බි. 22බී) | <br><br><br>100,000<br>150,000 | <br><br><br>50,000<br>50,000 | <br><br><br>250,000<br>250,000 |
| 29. | රටබීම බලපත්‍ර සමග නිකුත් කරනු ලබන අරක්කු විකිණීමේ බලපත්‍ර<br>(i) සුරාබද්දු අ. (ර. බි.) 1 බලපත්‍රය<br>(ii) සුරාබද්දු අ. (ර. බි.) 2 බලපත්‍රය<br>(iii) සුරාබද්දු අ. (ර. බි.) 3 බලපත්‍රය<br>(iv) සුරාබද්දු අ. (ර. බි.) 4 බලපත්‍රය | <br><br>50,000<br>50,000<br>100,000<br>100,000 | <br><br>25,000<br>25,000<br>50,000<br>50,000 | <br><br>250,000<br>250,000<br>250,000<br>250,000 |
| 30. | රටබීම බලපත්‍ර සමග නිකුත් කරන බෝතල් රා විකිණීම සඳහා වූ උපාංගික බලපත්‍රය | 50,000 | 100,000 | 200,000 |
| 31. | වතු ආපනශාලා බලපත්‍රය<br>(i) රා පමණක් විකිණීම සඳහා<br>(ii) රා සහ අරක්කු විකිණීම සඳහා | <br>50,000<br>100,000 | <br>50,000<br>100,000 | <br>100,000<br>200,000 |
| 32. | වයින් ස්ප්‍රීතු විකිණීම සඳහා වූ බලපත්‍රය | 10,000 | 5,000 | 50,000 |
| 33. | පදම්කළ අරක්කු නිෂ්පාදනය කිරීම සහ පදම්කළ අරක්කු තොග වශයෙන් විකිණීම සඳහා වූ බලපත්‍රය | එක් බලපත්‍රයකට රු. 1,500,000ක අවමයකට යටත්ව දැනට පවත්නා වර්ෂයේ අගෝස්තු 31 වැනි දිනට අවසන් වන පිළිවෙලට යෙදුණු මාස 12 ක | එක් සුරාබද්දු බලපත්‍රයක් සඳහා රු. 20,000,000 බැගින් | 25,000,000 |
| 34. | ඉක්ෂුපාක/උක් අරක්කු නිෂ්පාදනය කිරීමට සහ ඉක්ෂුපාක/උක් අරක්කු තොග වශයෙන් විකිණීම සඳහා වූ බලපත්‍රය | | | |
| 35. | විශේෂ අරක්කු නිෂ්පාදනය කිරීමට සහ විශේෂ අරක්කු තොග වශයෙන් විකිණීම සඳහා වූ බලපත්‍රය | | | |
| 36. | පොල් අරක්කු නිෂ්පාදනය කිරීමට සහ පොල් අරක්කු තොග වශයෙන් විකිණීම සඳහා වූ බලපත්‍රය | | | |

| *I* වන තීරුව | *II* වැනි තීරුව | *III* වැනි තීරුව | *IV* වැනි තීරුව | *V* වැනි තීරුව |
|---|---|---|---|---|
| **අනු අංකය** | **සුරාබදු බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය** | **වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තුව (රුපියල්)** | **ආරක්ෂිත ඇප තැන්පතු මුදල (රුපියල්)** | **කර්මාන්ත ප්‍රවේශය සඳහා එක් වරක් අයකරනු ලබන ගාස්තුව (රුපියල්)** |
| | | කාල පරිච්ඡේදය තුළ සුරාබදු බලපත්‍ර ස්ථානයේ අරක්කු බෝතල් ගත කිරීම/ නිකුත් කිරීම පදනම මත ගණනය කොට සුරාබදු බලපත්‍රයේ කාලපරිච්ඡේදය තුළ ස්ථානයේ ඇස්තමේන්තු කළ අරක්කු බෝතල් ගත කිරීම හෝ නිකුත් කිරීම තොග ලීටරයකට රුපියල් 3 බැගින් | | |
| 37. | තල් අරක්කු නිෂ්පාදනය කිරීමට සහ තල් අරක්කු තොග වශයෙන් විකිණීම සඳහා වූ බලපත්‍රය | එක් බලපත්‍රයකට රු. 500,000 ක අවමයකට යටත්ව දැනට පවත්නා වර්ෂයේ අගෝස්තු 31 වැනි දිනට අවසන් වන පිළිවෙලට යෙදුණු මාස 12ක කාලපරිච්ඡේදය තුළ සුරාබදු බලපත්‍ර ස්ථානයේ තල් අරක්කු බෝතල් ගත කිරීම/නිකුත් කිරීම පදනම මත ගණනය කොට සුරාබදු බලපත්‍රයේ කාලපරිච්ඡේදය තුළ ස්ථානයේ ඇස්තමේන්තු කළ තල් අරක්කු බෝතල් ගත කිරීම හෝ නිකුත් කිරීම තොග ලීටරයකට රුපියල් 3 බැගින් | එක් සුරාබදු බලපත්‍රයක් සඳහා වූ රු. 5,000,000 බැගින් | 5,000,000 |
| 38. | මෙරට සෑදූ විදේශ මත්පැන් නිෂ්පාදනය කිරීමේ බලපත්‍රය | රු. 5,000,000 ක අවමයකට යටත්ව දැනට පවත්නා වර්ෂයේ අගෝස්තු 31 වැනි දිනට අවසන් වන පිළිවෙලට යෙදුණු මාස 12ක කාලපරිච්ඡේදය තුළ සුරාබදු බලපත්‍ර ස්ථානයේ විදේශ මත්පැන් බෝතල් ගත කිරීම/නිකුත් කිරීම පදනම මත ගණනය කොට සුරාබදු බලපත්‍රයේ කාල පරිච්ඡේදය තුළ ස්ථානයේ ඇස්තමේන්තු කළ විදේශ පත්පැන් බෝතල් ගත කිරීම හෝ නිකුත් කිරීම තොග ලීටරයකට රුපියල් 3 බැගින් | එක් සුරාබදු බලපත්‍රයක් සඳහා වූ රු. 20,000,000 බැගින් | 25,000,000 |
| 39. | විකිණීම සඳහා ධාන්‍ය මත්පැන් නිෂ්පාදනය හෝ බෝතල් ගත කිරීමේ බලපත්‍රය | රු. 5,000,000 ක අවමයකට යටත්ව දැනට පවත්නා වර්ෂයේ අගෝස්තු 31 වැනි දිනට අවසන් වන පිළිවෙලට යෙදුණු මාස 12 ක කාලපරිච්ඡේදය තුළ සුරාබදු බලපත්‍ර ස්ථානයේ ධාන්‍ය මත්පැන් බෝතල් ගත කිරීම/ නිකුත් කිරීම පදනම මත ගණනය කොට සුරාබදු බලපත්‍රයේ කාලපරිච්ඡේදය තුළ ස්ථානයේ ඇස්තමේන්තු කළ ධාන්‍ය මත්පැන් බෝතල් ගත කිරීම හෝ නිකුත් කිරීම තොග ලීටරයකට රුපියල් 3 බැගින් | එක් සුරාබදු බලපත්‍රයක් සඳහා වූ රු. 20,000,0000 බැගින් | 25,000,000 |

EOG 12-0073

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.